**www.wsws.org** ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ශ්‍රී ලංකාවේ යුද විරෝධී රැලියට මැර ප්‍රහාරයක්

**Mob attacks Sri Lankan antiwar rally**

**සරත් කුමාර විසිනි**
**2007 ජනවාරි 13**

නියෝජ්‍ය කම්කරු ඇමති මර්වින් සිල්වාගේ නායකත්වයෙන් යුක්ත මැර කල්ලියක් අඟහරුවාදා (ජනවාරි 9) දින යුද විරෝධී රැලියකට පහර දී එය කඩාකප්පල් කලහ. මෙම සිද්ධිය දෙමල ඊලම් විමුක්ති කොටි සංවිධානයට (එල්ටීටීඊ) එරෙහිව යුද්ධය උග්‍ර කරමින් සිටින ආන්ඩුවේ මැරකම, එයට එල්ල වන ඕනෑ ම විරුද්ධත්වයක් බිඳ දැමීමෙහි තවත් එක් ඇඟවීමකි.

නුගේගොඩ දී පැවැත්වීමට නියමිතව තිබූ මෙම රැලිය මෑතකදී පිහිටුවා ගත් එක්සත් ජනතා ව්‍යාපාරය (යූපීඑම්) සංවිධානය කලේ යුද්ධයට, රාජ්‍ය මර්දනයට හා බඩු මිල වැඩි වීමට විරෝධය පෑම සඳහා ය. පුලුල් පෙරමුනක් වන මෙම සංවිධානයේ රැස්වීම, දක්ෂිනාංශික එක්සත් ජාතික පක්ෂයේ (යූඑන්පී) ද, වාමාංශික පක්ෂ ගනනාවක ද, එල්ටීටීඊ හිතවාදී දෙමල ජාතික සංධානයේ (ටීඑන්ඒ) ද නියෝජිතයන් විසින් ඇමතීමට නියමිතව තිබුනි.

රැස්වීම ආරම්භවීමට පැය භාගයකට පෙර 100ක් පමන වූ ආයුධ සන්නද්ධ මැරයන් පිරිසක් රැස්වීම් භූමියට කඩා වැදුනි. බීබීසී සිංහල සේවයේ මාධ්‍යවේදී අජිත් සෙනවිරත්න මෙසේ පැවසීය: "වේදිකාව අසලින් මා ගමන් ගනිද්දී යමෙක් මාව නියෝජ්‍ය ඇමති මර්වින් සිල්වාට පෙන්වීය. ඔහු "ඌට ගහපියව්! මුන් ඔක්කොමන්ටම ගහපියව්!" යනුවෙන් කෑ ගැසීමත් සමග ම මැරයන් මට පහර දීමට පටන් ගත්තේ ය."

කුප්‍රකට මත්ද්‍රව්‍ය ව්‍යාපාරික "කුඩු ලාල්" ද සිද්ධියට සම්බන්ධ වූ බව එක්සත් සමාජවාදී පක්ෂයේ නායක සිරිතුංග ජයසූරිය පුවත්පත් සාකච්ඡාවකදී පැවසීය. පොලු මුගුරුවලින් සන්නද්ධ වී සිටි මැරයෝ වේදිකාවේ සිටි අයට පහර දුන්හ. මාධ්‍යවේදීන් තිදෙනකුට පහර දී කැමරා දෙකක් විනාශ කෙරිනි. එහි සිටි පොලීසිය ප්‍රහාරය වැලැක්වීමට කිසිවක් කලේ නැත.

රැස්වීමේ සංවිධායකයෝ ජනාධිපති මහින්ද රාජපක්ෂ මැර ප්‍රහාරය පිටුපස සිටින්නේ යයි චෝදනා කලහ. පෙරදින රාත්‍රියේ තමන්ට කතා කල පොලීසිය රැලියට ප්‍රහාරයක් එල්ල විය හැකි නිසා එය අවලංගු කරන ලෙස ඉල්ලා සිටි බව ජයසූරිය කිවේ ය. රැස්වීමට ආරක්ෂාව සපයනු වෙනුවට පොලීසිය, ප්‍රහාරය සඳහා කුමන්ත්‍රනය කර ඇති බව පෙනීයයි.

එජාප පාර්ලිමේන්තු මන්ත්‍රී දයාසිරි ජයසේකර මාධ්‍ය වෙත කීවේ: රැස්වීම නතර කරන ලෙසට ආරක්ෂක අමාත්‍යංශය පොලීසියට නියෝග කොට තිබූ බවයි. රැස්වීමට පෙර නුගේගොඩ ප්‍රධාන මාර්ගයේ රථවාහන ගමනාගමනය නතර කල පොලීසිය බෝම්බ තර්ජනයක් තිබෙන බව කියමින් බෝම්බ නිෂ්ක්‍රීය අංශය කැඳවීය. ප්‍රහාරයෙන් පසු පොලිස් නිලධාරීන් සමග කතා කරමින් සිල්වා එහි රැඳී සිටියේ ය.

සිල්වා සහ ඔහුගේ මැරයෝ රැලිය කඩාකප්පල් කරද්දී ෆැසිස්ට් වර්ගයේ ත්‍රස්ත විරෝධී ජාතික ව්‍යාපාරය (එන්එම්ඒටී), එක්සත් ජනතා ව්‍යාපාරය එල්ටීටීඊ හිතවාදී සංවිධානයක් යැයි හෙලා දකින අත්පත්‍රිකා බෙදා හැරියේ ය. ත්‍රස්ත විරෝධී ජාතික ව්‍යාපාරයේ විකෘත වාර්ගික තර්කනයට අනුව, හමුදාව සිය මෙහෙයුම්වලින් ජයග්‍රහන ලබමින් සිටින අතරතුර, සාමය සඳහා ආයාචනා කිරීම මගින් එක්සත් ජනතා ව්‍යාපාරය එල්ටීටීඊයට සහයෝගය දෙයි.

මෙම රැලියට එල්ල වූ ප්‍රහාරය හුදකලා සිද්ධියක් නොවේ. එදින ම කැරලි මර්දන පොලිස් බටයන් කොලඹ ප්‍රවාහන ආමාත්‍යංශය ඉදිරිපිට උද්ඝෝෂනයේ යෙදුනු රජයට අයත් ගමනාගමන මන්ඩල සේවකයන්ට පහර දුන්හ. වෘත්තීය සමිති නායකයින් හතර දෙනෙක් අත්අඩංගුවට ගනු ලැබුනි. හිඟ වැටුප් ලබාගැනීම සඳහා කම්කරුවෝ උද්ඝෝෂනය කලහ.

කොටසක් රජයට අයිති ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනයේ පරිපාලනය ඊට පෙර දින විදුලිසංදේශ වෘත්තීය සමිතියේ කිසිදු කාර්මික ක්‍රියාමාර්ගයකට එරෙහිව උසාවි නියෝගයක් ලබා ගත්හ. ටෙලිකොම් සේවකයෝ වැඩි වැටුප් ඉල්ලා බදාදා වැඩ වර්ජනය කිරීමට සූදානමින් සිටියහ. සමාගමේ තර්කය වුයේ යෝජිත වැඩ වර්ජන ක්‍රියා මාර්ගයෙන් රටෙහි

ආර්ථිකයටත් ජාතික ආරක්ෂාවටත් පිරිමැසිය නො හැකි පාඩුවක් ඇති විය හැකි බවයි.

සිංහල අන්තවාදී පක්ෂවල සහයෝගය ලබන රාජපක්ෂ ආන්ඩුව, තම මිලිටරි ආක්‍රමනයට එරෙහි විරුද්ධත්වය මැඩීමට පමනක් නොව වැඩ වර්ජන හා විරෝධතා මර්දනය සාධාරනීකරනය කිරීමට ද, හිතාමතා ම යුද උන්මාදී පරිසරයක් ගොඩ නගමින් සිටියි. උත්සන්න කෙරෙන යුද්ධය, මූලික ප්‍රජාතන්ත්‍ර අයිතීන් මත එල්ල කරන දුර දිග යන ප්‍රහාරයක් සමග එකට ගමන් කරයි.

හමුදාව තම ප්‍රහාර ආරම්භ කල ජුලි මාසයේ දී, නම් කරන ලද කර්මාන්තවල වෘත්තීය ක්‍රියාමාර්ග වලක්වා ලීමට පදනම සපයන අත්‍යවශ්‍ය සේවා නියෝගයක් සමගින් හදිසි නීති රෙගුලාසි පැනවීමට රාජපක්ෂ ක්‍රියා කලේ ය. දෙසැම්බරයේ දී ජනාධිපතිවරයා නඩු විභාගයකින් තොරව පුද්ගලයන් අත්අඩංගුවේ තබා ගැනීමට බලතල පවරන කෲර ත්‍රස්තවාදය වැලැක්වීමේ පනත යලි පැනවූ අතර එය පුලුල් කලේ ය.

නිල පුවත් පාලනය තවමත් පනවා නොමැති වුව ද ජනාධිපතිවරයා හා මිලිටරි ප්‍රධානීහු, ආරක්ෂාව අනතුරේ නොහෙලන ලෙස මාධ්‍ය වෙත අවවාද කොට ඇත. ආරක්ෂක හමුදාවන්ට චෝදනා එල්ලවන සිද්ධීන් කිහිපයක දී, මාධ්‍යවේදීන් ගනනාවක් ඝාතනය කරනු ලැබ ඇත.

තම ප්‍රතිපත්තිවලට එරෙහි ඕනෑ ම විරෝධතාවක් මැඩීමට හා ත්‍රස්ත කිරීමට ආන්ඩුව හුදෙක් නෛතික පියවරයන් මත පමනක් නොව, සංවිධිත ප්‍රචන්ඩත්වයේ සරන සෙවීමට ද හොඳින් ම සූදානම් බවට, යුද විරෝධී රැලියට එල්ල වූ ප්‍රහාරය අනතුරු ඇඟවීමකි.

© www.wsws.org